**අකුරණ ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 07 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට අකුරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් කොටස් 07 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අයිතිය පවරා ගෙන නොතිබූ රු.26,891,063 ක් වටිනා වාහන 03 ක් ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 1.3.2 ලැබියයුතු ගිණුම්.

2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 06 ක එකතුව රු.43,337,506 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.6,896,804 ක් වී තිබුණි. 2016 අප්‍රේල් 30 දින වන විට එම ශේෂයන්ගෙන් රු.7,835,675 ක් තවදුරටත් ලැබියයුතුව පැවතුණි.

### 1.3.3 ගෙවියයුතු ගිණුම්.

2015 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.29,681,099 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.5,595,912 ක් වී තිබුණි. 2016 අප්‍රේල් 30 දින වන විට එම ශේෂයන්ගෙන් රු.17,999,175 ක් තවදුරටත් ගෙවියයුතුව තිබුණි.

**1.3.4 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

-----------------------------------------------------

පහත සදහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති. | |
| | 218 | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසී සංග්‍රහය. | |
| | 571(2) | රු.572,465 ක් වූ කල් ඉකුත් තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය. | |
| | xxiv පරිච්ඡේදයේ 44 ඡේදය | මිය ගිය නිලධාරීයෙකුගෙන් අය වියයුතු වසරක කාලයක් ඉක්මවා තිබූ රු.39,875 ක ආපදා ණය ශේෂයක් සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඈ) | වෙනත්. | |
| | 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන නාගරික සංවර්ධන අධිකාරියේ ගැසට් නිවේදනය | 2011 සිට 2015 කාල පරිච්ඡේදය තුළ අනුමත කළ ගොඩනැගිලි අයදුම්පත් 388 කින් 346 ක් සඳහා අනුකූලතා සහතික ලබා ගෙන නොතිබුණි |

## 2. මූල්‍ය සමාලෝචනය.

## 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,037,958 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,464,938 ක් වුයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,426,980 ක අඩුවීමක් දක්නට ලැබුණි.

## 2.2 විශ්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය කාර්යය සාධනය පිළිබද වැදගත් අනුපාත කීපයක් පහත දැක්වේ.

(අ) මෙහෙයුම් ආදායමට අතිරික්තය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ගත් විට එම ප්‍රතිශතයේ පිරිහීමක් පෙන්නුම් කෙරේ.

(ආ) මුළු ආදායම සහ මුළු වියදම සැසඳීම.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුළ මුළු වියදමට මුළු ආදායමෙහි ප්‍රතිශතය ඉහළ යැමක් පෙන්නුම් කෙරෙන අතර, එය මූල්‍ය පාලනය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් නොකෙරේ.

## 2.3 ආදායම් පරිපාලනය.

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015.01.01 දිනට හිඟ ශේෂය | බිල් කිරීම් | අධි ගාස්තු | දුන් වට්ටම් කපා හැරීම් | හිගයෙන් ලැබීම් | බිල් කිරීම්වලින් ලැබීම් | 2015.12.31 දිනට හිඟ ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 3,007,071 | 5,936,697 | 408,094 | 243,982 | 1,646,272 | 4,787,531 | 2,674,077 |
| අක්කර බදු | 1,295 | 300 | 09 | -- | 1,295 | 300 | -- |
| බදු කුළී | 392,498 | 3,272,756 | 63,360 | 9,766 | 251,430 | 3,195,497 | 271,921 |
| බලපත්‍ර ගාස්තු | -- | 2,036,650 | -- | -- | -- | 2,036,650 | -- |
| වෙනත් ගාස්තු | 8,115,124 | 12,227,218 | 1,727 | 264,670 | 6,764,443 | 332,527 | 12,982,429 |
| | | | | | | | 15,928,427 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.15,928,427 ක හිඟ ආදායම් ශේෂයක් නිරීක්ෂණය විය.

### 2.3.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට රු.3,007,071 ක් වූ හිග ශේෂයක් පැවති අතර, බිල් කිරීම් රු.5,936,697 ක් වී තිබුණි. මෙම ශේෂයන්ගෙන් වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය පිළිවෙළින් සියයට 54 ක් හා සියයට 80 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.2,674,077 ක හිග වරිපනම් බදු ශේෂයක් පැවතුණි. එයින් වසරකට වැඩි හිග ශේෂය රු.1,360,798 ක් වූ නමුත්, එම හිග අය කර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3.3 කඩ කුළී.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.271,921 ක හිග ශේෂයක් පැවති අතර, මෙම හිග ශේෂය තුළ මාස 04 සිට අවුරුදු 05 දක්වා කාල පරාසයක් තුළ අය වියයුතු රු.124,441 ක මුදලක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අකුරණ වෙළඳ සංකීර්ණයේ කොරිඩෝවට අයත් කොටසක් වෙළදාම් කිරීමේ හැකියාව සොයා නොබලා බදු දීම හේතුවෙන්, මාස කීපයක් තුළ වෙළදාම අත හැර ව්‍යාපාරය වසා දමා තිබුණ ද, පසු විපරම් නොකර බිල් කිරීම නිසා, රු.22,205 ක හිග කඩ කුළී ශේෂයක් ඇති වී තිබුණි.

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තුවල වටිනාකම රු.12,976,004 ක් විය.

**2.3.5 බලපත්‍ර ගාස්තු**

බල ප්‍රදේශයේ ව්‍යාපාර ආයතන පිළිබදව කරන ලද සමීක්ෂණය අනුව, කර්මාන්ත හා ව්‍යාපාර ආයතන 57 ක් සදහා වෙළඳ බලපත්‍ර නිකුත් කර නොතිබූ අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

**3.1 කාර්යය සාධන ඇගයීම**

සමාලෝචිත වර්ෂයේ රු.17,431,271 ක මුදලක් ස්වයං උත්පාදන ආදායම ලෙස සභාව උපයා තිබූ අතර, එයින් සංවර්ධන කටයුතු සදහා වැය කර තිබූ වටිනාකම රු.5,324,216 කි. මෙය ස්වයං උත්පාදන ආදායමින් සියයට 30.54 ක ප්‍රතිශතයක් විය.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ "වාණිජ කොටස" යනුවෙන් නම් කර තිබූ බිම් මහලෙහි ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති වර්ග අඩි 2150 ක භූමි ප්‍රමාණයක් දැනට වසර 02 ට අධික කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන වසා දමා තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 හා 2015 වර්ෂවල අනවසර ඉදි කිරීම් 53 ක් හදුනා ගෙන ලේඛනගත කර අනවසර දැන්වීම් යැවීම පමණක් සිදු කර තිබූ නමුත්, වෙනත් කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි.

(ආ) අකුරණ නගරයේ අභ්‍යාන්තර මාර්ග ආශ්‍රිතව 2016 අප්‍රේල් 05 දින කරන ලද භෞතික පරීක්ෂාවේ දී විශාල ප්‍රමාණයක අනවසර ඉදි කිරීම් නිරීක්ෂණය වූ අතර, ඒ සම්බන්ධව අදාළ නිලධාරීන්ගේ අවධානයට ලක් ව නොතිබුණි.

**3.4 කොන්ත්‍රාත් පරිපාලනය.**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) පල්ලේවැලිකැටිය දෙල්ගහගොඩ වත්ත පාර සංවර්ධනය කිරිම - රු.200,000**

---

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 අප්‍රේල් 05 දින කරන ලද භෞතික පරික්ෂාවේදී පහත කරුණු අණාවරණය විය.

(i) ඉදි කර තිබුණු ආරක්ෂිත බැම්ම සඳහා 6"x9" ප්‍රමාණයට වඩා විශාල ප්‍රමාණයේ ගල් යොදා ගෙන ඉදි කිරීම් කටයුතු කර තිබුණි.

(ii) 1:5 සිමෙන්ති වැලි මිශ්‍රණයෙන් බදාම යොදා බැම්ම ඉදි කිරීම හා බැම්මෙහි මතුපිට කපරාරුව කළයුතු වුවත්, පහසුවෙන් අතින් කැඩිය හැකි මට්ටමේ ඉතා අඩු මිශ්‍රණයක් යොදා ඉදි කර තිබුණි.

**(ආ) ප්‍රමුඛතාවය අනුව සංවර්ධන කාර්යයන් ඉටු නොකිරීම.**

---

බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ඉටු කිරීමේ දී අවශ්‍යතාවයන් හඳුනා ගෙන එකී අවශ්‍යතාවයන්ගේ ප්‍රමුඛතාවය සකස් කර, ඒ අනුව ඉදි කිරීම් කටයුතු සැළසුම් කළයුතු වුවත්, එසේ කිරීමකින් තොරව විටින් විට ඉදිරිපත් කරන මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර තිබුණි.

**(ඇ) කාණු ඉදි නොකිරීම.**

---

මාර්ග කොන්ක්‍රීට් කිරීමේදී මාර්ග දෙපස කාණු ඉදි කිරීමට සැළසුම් නොකිරීම හා කොන්ක්‍රීට් මාර්ගයේ උරහිස් පුරවා සකස් නොකිරීමෙන්, වැසි ජලය මාර්ගය පුරා ගලා යාමෙන් මාර්ගයට හානී සිදුව තිබූ අතර, මෙමගින් ප්‍රදේශයේ ජන ජීවිතයට මෙන්ම මාර්ගයේ ගමන් කරන මගීන්ට හා වාහනවලට හානී සිදු වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

**3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.**

---

සභා බල ප්‍රදේශයේ මාර්ග අද්දර දමන කසළ එකතු කිරීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබූ බැවින්, මහා මාර්ගය දෙපස බැහැරලන කසළ ප්‍රමාණය දිනෙන් දින වැඩි වී තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.**

---

**4.1 අයවැය පාලනය.**

---

(අ) පූර්ව වර්ෂයේ දී සංවර්ධන යෝජනා ලබා ගෙන ප්‍රමුඛතාවය සකස් කර ඉදිරි වර්ෂයේ දී ක්‍රියාත්මක කිරිමට සැළසුම් කරන ව්‍යාපෘතීන් සඳහා විධිමත් පරිදි කාර්මික නිලධාරීන්ගෙන් ඇස්තමේන්තු ලබා ගෙන එකී ඇස්තමේන්තු වටිනාකම අනුව අයවැය පිළියෙළ කළයුතු වුවත්, එසේ කිරීමකින් තොරව කර්මාන්ත 35 ක් සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස රු.3,200,000 ක් හා පොදු

සංවර්ධන කටයුතු සඳහා රු.435,000 ක් වශයෙන් දළ වටිනාකම් යොදා අයවැය ඇස්තමේන්තු පිළියෙළ කර සම්මත කර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් 05 ක සියයට 15 සිට සියයට 71 ක් දක්වා ද, වියදම් විෂයයන් 06 ක සියයට 18 සිට සියයට 44 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ අතර, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

**4.2 සංයුක්ත සැළැස්ම.**

**----------------------**

සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය.**

**---------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**----------------------------------------**

අංක WPLL – 6410 ඩ්‍රම් ට්‍රක් රථය 2015 පෙබරවාරි 07 දින සභාවට භාර ගත් දිනයේ සිට 2016 පෙබරවාරි 17 දින දක්වාම එක් දිනක් පමණක් කසළ ප්‍රවාහනයට යොදා ගැනීමෙන් පසු නිෂ්කාර්යයව සහා භූමියේ ගාල් කර තිබුණි.

**5. පද්ධති හා පාලනය.**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය.
(ආ) කසළ කළමනාකරණය.
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය.
(ඈ) වත්කම් කළමනාකරණය.